සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Western Province Educational Department**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)**
**General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)**

| | | |
|---|---|---|
| සංයුක්ත ගණිතය I<br>Combined Mathematics I | 10 S I | 2023.12.14 / 08.30 - 11.40 |

AL API ( PAPERS GROUP )

## B කොටස

■ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**11.** (a) සියලු $x \in \mathbb{R}$ සඳහා, $F(x) \equiv px^2 + qx + r$ ; $p \neq 0, (p,q,r) \in \mathbb{R}$ යැයි ගනිමු. සමීකරණය විසඳීමෙන් හෝ අන්අයුරකින් හෝ $F(x)=0$ වර්ගජ සමීකරණයට තාත්වික මූල පවතී නම්, $\Delta \geq 0$ වන බව සාධනය කරන්න. මෙහි $\Delta = q^2 - 4pr$ වේ.

තවද $(p,q,r) \in \mathbb{Q}$ වන විට $F(x)=0$ වර්ගජ සමීකරණයට තාත්වික **පරිමේය මූල පැවතීමට** අවශ්‍යතාව ලියා දක්වන්න.

තවදුරටත්, 1 යන්න $F(x)=0$ හි මූලයක් නම්, $p+q+r=0$ වන බව ද පෙන්වන්න.

දැන් $2ax^2 - (2a+b+c)x + b + c = 0$ $a \neq 0$, $(a,b,c) \in \mathbb{Q}$ සමීකරණයේ මූල $\alpha$ හා $\beta$ යැයි ගනිමු.

$\dfrac{1}{\alpha}$ හා $\dfrac{1}{\beta}$ මූල වන වර්ගජ සමීකරණය $G(x)=0$ මගින් ලබා දේ නම්, $G(x)$ ලියා දක්වන්න.

$G(x)=0$ හි විවේචකය $a$, $b$ හා $c$ ඇසුරෙන් ලියා දක්වා **ඒ නයින්**, $\dfrac{1}{\alpha}$ හා $\dfrac{1}{\beta}$ පරිමේය වන බව **අපෝහනය** කරන්න.

තවද $b$, $a$ හා $c$ පිළිවෙලින් සමාන්තර ශ්‍රේණියක අනුයාත පද ලෙස පිහිටයි නම්, $G(x)=0$ හි මූල තාත්වික සමපාත වන බව ද **අපෝහනය** කරන්න.

(b) $H(x)$ යනු මාත්‍රය 3 වූ බහුපදයක් යැයි ගනිමු. $H(x)$ යන්න $(x-1)$, $(x-2)$ හා $(x-3)$ යන ඒකජ මගින් වෙන වෙනම බෙදූ විට ශේෂය 7 බව දී ඇත. තවදුරටත්, $H(x)$ යන්න $(x-4)$ න් බෙදූ විට ශේෂය 1 බව දී ඇත්නම්, $H(x) \equiv (ax+b)(x-2)(x-3)+c$ ආකාර වන පරිදි $a$, $b$ හා $c$ නිඛිල අගයන්න.

**12.** (a) $a, b \in \mathbb{R}$ යැයි ගනිමු. $x$ හි බල **ආරෝහණය** වන පරිදි $(ax+by)^n : n \in \mathbb{Z}^+$ ප්‍රසාරණය ලියා ලියන්න.

දැන් $\left(ax + \dfrac{1}{x}\right)^n$ හි ප්‍රසාරණය සලකමු. මෙහි $x$ වලින් ස්වායත්ත පදයේ සංගුණකය $n$ හා $a$ ඇසුරෙන් ලියා දක්වන්න.

මෙම ප්‍රසාරණයේ හතර වන පදය $\dfrac{5}{54}$ බව දී ඇත්නම්, $n$ හා $a$ හි අගය සොයන්න.

තවද $\left(ax + \dfrac{1}{x}\right)^n$ හි ප්‍රසාරණයේ මැද පදය ලියා දක්වන්න.

තවදුරටත් මෙම ප්‍රසාරණයේ සංගුණකවල එකතුව $\left(\dfrac{\alpha+1}{\alpha}\right)^m$ වන පරිදි $\alpha$ හා $m$ නිඛිල **අපෝහනය** කරන්න.

(b) $r \in \mathbb{Z}^+$ සඳහා, $A(r+1)(3r+5)-B(r+2)(3r-1) \equiv 6r^2+19r+17$ වන පරිදි $A$ හා $B$ තාත්ත්වික නියත සොයන්න. දැන් $r \in \mathbb{Z}^+$ සඳහා, $U_r = \dfrac{6r^2+19r+17}{(3r-1)(3r+2)(3r+5)}$ යැයි ගනිමු.

$U_r = k \cdot V_r - V_{r+1}$ වන පරිදි $V_r$ ලියා දක්වන්න. මෙහි $k$ යනු නිර්ණය කළ යුතු ධන නිඛිලයකි.

**ඒ නයින් හෝ අන් අයුරකින් හෝ,** $\dfrac{U_r}{3^r} = f(r) - f(r+1)$ වන පරිදි $f(r)$ ලියා දක්වමින්, $n \in \mathbb{Z}^+$ සඳහා $\displaystyle\sum_{r=1}^{n} \frac{U_r}{3^r} = \frac{1}{5} - \frac{(n+2)}{(3n+2)(3n+5)} \cdot \frac{1}{3^n}$ බව පෙන්වන්න.

තවදුරටත්, $\displaystyle\sum_{r=1}^{\infty} \frac{U_r}{3^r}$ අපරිමිත ශ්‍රේණිය අභිසාරී බව පෙන්වා, එහි ඓක්‍යය සොයන්න.

**ඒ නයින්,** $\displaystyle\sum_{r=2}^{\infty} \frac{U_r}{3^{r-1}}$ හි අගය **අපෝහනය** කරන්න.

13. (a) $a \in \mathbb{R}$ වන පරිදි, $\mathbf{A} = \begin{pmatrix} 2a+1 & 3 \\ 2a-1 & a \end{pmatrix}$ යැයි ගනිමු. $\mathbf{A}$ හි ප්‍රතිලෝම න්‍යාසය $\mathbf{A}^{-1}$ **පවතින පරිදි** $a$ ට ගත හැකි අගයයන් සොයන්න.

තවද $a \in \mathbb{Z}$ වන පරිදි $\mathbf{A}$ හි නිශ්චායකය $1$ බව දී ඇත්නම් $a$ හි අගය සොයන්න.

එම $a$ අගය සඳහා $\mathbf{A}$ හා $\mathbf{A}^{-1}$ ලියා දක්වන්න.

$\mathbf{AB} = \begin{pmatrix} 1 \\ 1 \end{pmatrix}$ හා $\mathbf{A}^{-1}\mathbf{C} = \begin{pmatrix} 1 \\ 1 \end{pmatrix}$ වන පරිදි $\mathbf{B}$ හා $\mathbf{C}$ තීර න්‍යාස සොයන්න.

තවද $\mathbf{BC}^{\mathrm{T}}$ න්‍යාසය සොයන්න. මෙහි $\mathbf{C}^{\mathrm{T}}$ යනු $\mathbf{C}$ හි පෙරලුම් න්‍යාසයයි.

(b) $x, y \in \mathbb{R}$ හා $z \in \mathbb{C}$ යැයි ගනිමු. $z = x+iy$ වන පරිදි $\mathrm{Re}(z), \mathrm{Im}(z)$ හා $|z|$ ලියා දක්වන්න.

$|z|^2 = (\mathrm{Re}(z))^2 + (\mathrm{Im}(z))^2$ බව පෙන්වන්න.

$-\pi < \theta \le \pi$ සඳහා $z = \cos\theta + i\sin\theta$ යැයි ගනිමු. ආර්ගන්ඩ් සටහනක $z$ නිරූපණය කරන්න.

$\omega = \dfrac{-1}{2} + \dfrac{\sqrt{3}}{2}\mathrm{i}$ බව දී ඇත්නම්, $\omega$ හා $\omega^2$ සංකීර්ණ සංඛ්‍යා $z$ හි පථය මත පිහිටන බව පෙන්වා

**ඒ නයින්,** $|\omega - 1| = |\omega^2 - 1| = |\omega - \omega^2|$ බව **අපෝහනය** කරන්න.

(c) $z_1 = 1 + \sin\left(\dfrac{\pi}{8}\right) + i\cos\left(\dfrac{\pi}{8}\right)$ හා $z_2 = 1 + \sin\left(\dfrac{\pi}{8}\right) - i\cos\left(\dfrac{\pi}{8}\right)$ යැයි ගනිමු.

$z_1 = (1+\cos\theta) + i\sin\theta$ ; $\dfrac{\pi}{4} < \theta < \dfrac{\pi}{2}$ වන පරිදි $\theta$ අගයන්න. තවදුරටත්,

$z_1$ හා $z_2$ සංකීර්ණ සංඛ්‍යා, $z_n = r_n(\cos\theta_n + i\sin\theta_n)$ ; $n = 1, 2$ ආකාරයෙන් ප්‍රකාශ කරන්න.

මෙහි $r_n$ හා $\theta_n \left(\dfrac{-\pi}{4} < \theta_n < \dfrac{\pi}{4}\right)$ යනු නිර්ණය කළ යුතු තාත්ත්වික නියත වෙයි. දැන් $\omega = \dfrac{z_1}{z_2}$ යැයි ගනිමු. **ද මුවාවර් ප්‍රමේයය භාවිතයෙන් හෝ අන් අයුරකින් හෝ** $\mathrm{Re}\left(\omega^{\frac{8}{3}}\right) = -1$ බවත්, $\mathrm{Im}\left(\omega^{\frac{8}{3}}\right) = 0$ බවත් අපෝහනය කරන්න.

AL API ( PAPERS GROUP )


**14.** (*a*) $x \neq 1$ සඳහා $f(x)=\dfrac{ax+b}{(x-1)^2};(a,b)\in\mathbb{Z}$ යැයි ගනිමු. $f(x)$ හි ව්‍යුත්පන්නය, $f'(x)$ යන්න $x \neq 1$ සඳහා $f'(x)=\dfrac{-(x+a)}{(x-1)^3}$ වන පරිදි $a$ හා $b$ අගයන්න.

**ඒ නයින්,** $f(x)$ අඩුවන ප්‍රාන්තර හා $f(x)$ වැඩිවන ප්‍රාන්තරය සොයන්න. $f(x)$ හි හැරුම් ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ද සොයන්න. $x \neq 1$ සඳහා $f''(x)=\dfrac{2(x+2a)}{(x-1)^4}$ **බව දී ඇත.**

**ඒ නයින්,** $y=f(x)$ ප්‍රස්තාරය උඩු අවතල වන ප්‍රාන්තර හා යටි අවතල වන ප්‍රාන්තරය සොයන්න. $y=f(x)$ ප්‍රස්තාරයේ නතිවර්තන ලක්ෂ්‍යයේ ඛණ්ඩාංක ද සොයන්න. $y$ අක්ෂය මත අන්තඃඛණ්ඩය, ස්පර්ශෝන්මුඛ, හැරුම් ලක්ෂ්‍යය හා නතිවර්තන ලක්ෂ්‍යය දක්වමින් $y=f(x)$ හි ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න.

තවදුරටත්, $x\in(-\infty,1)$ වසම තුළ $y=|f(x)|$ හි ප්‍රස්තාරය **අපෝහනය** කරන්න.

(*b*) යාබද රූපයේ දක්වෙන්නේ අරය ඒකක 1ක් වූ වෘත්තාකාර ගෙමිදුලක, එකම විෂ්කම්භයක් මත කේන්ද්‍ර පිහිටියා වූ ද එකිනෙක ස්පර්ශ වන්නා වූ ද වෘත්තාකාර පෙදෙස් දෙකකි. මෙහි අඳුරු කර ඇති පෙදෙසේ තණ කොළ වවා ඇති නම්, තණ පෙදෙසේ වර්ගඵලය $A$ යන්න, $A=2\pi r(1-r)$ මගින් දෙනු ලබන බව පෙන්වන්න. මෙහි $r$ යනු කුඩා වෘත්තයේ අරය යි. $A$ උපරිම වන පරිදි $r$ අගයා, තණ පෙදෙසේ උපරිම වර්ගඵලය **අපෝහනය** කරන්න.



**15.** (*a*) සියලු $x\in\mathbb{R}$ සඳහා, $8x^3-2x+4\equiv(Ax+B)(2x-1)^2+B(4x^2-4x+3)(2x-1)+C(4x^2-4x+3)$ වන පරිදි $A,B$ හා $C$ **නිඛිල** අගයන්න. **ඒ නයින්,** $\dfrac{8x^3-2x+4}{(4x^2-4x+3)(2x-1)^2}$ යන්න භින්න භාගවලින් ලියා දක්වා $\displaystyle\int\frac{8x^3-2x+4}{(4x^2-4x+3)(2x-1)^2}dx$ සොයන්න.

AL API ( PAPERS

(*b*) $x\in\mathbb{R}^+$ සඳහා, $\dfrac{d\left(\frac{1}{2}\left(2x+(\ln x)^2\right)\right)}{dx}=\dfrac{x+\ln x}{x}$ බව පෙන්වන්න.

**කොටස් වශයෙන් අනුකලනය භාවිතයෙන් හෝ අන් අයුරකින් හෝ** $\displaystyle\int_1^2\frac{x+1}{x}\cdot\frac{2x+(\ln x)^2}{(x+\ln x)^2}\cdot dx=\frac{L(L+6)}{L+2}$ බව සාධනය කරන්න. මෙහි $L$ යනු නිර්ණය කළ යුතු තාත්ත්වික නියතයකි.

(*c*) $n\in\mathbb{Z}$ හා $x\neq(4n\pm1)\dfrac{\pi}{2}$ සඳහා, $\dfrac{1}{1+\sin x}\equiv\sec^2 x-\sec x\cdot\tan x$ බව සාධනය කරන්න.

**ඒ නයින්,** $\displaystyle\int_0^{\pi}\frac{1}{1+\sin x}\cdot dx=2$ ; බව පෙන්වන්න. $a,b\in\mathbb{R}$ හා $a<b$ යැයි ගනිමු. $\displaystyle\int_a^b f(x)dx=\int_a^b f(a+b-x)\cdot dx$ සූත්‍රය **පිහිටුවන්න.** තවද, $I=\displaystyle\int_0^{\pi}\frac{x\cdot\sin x}{1+\sin x}\cdot dx$ බව දී ඇත්නම්, $I=\dfrac{\pi}{2}(\pi-J)$ බව **අපෝහනය** කරන්න. මෙහි $J=\displaystyle\int_0^{\pi}\frac{1}{1+\sin x}dx$ වේ. **ඒ නයින්,** $I$ අගයන්න.

**16.** $y=m_1x+n_1$ හා $y=m_2x+n_2$ ; $m_1\neq m_2$, $m_1>m_2$ යැයි ගනිමු. මෙම සරල රේඛා යුගල අතර **සුළු කෝණය** $\tan^{-1}\left(\dfrac{m_1-m_2}{1+m_1m_2}\right)$ බව සාධනය කරන්න. $(\alpha,\beta)$ ලක්ෂ්‍යයෙහි සිට $x^2+y^2+2gx+2fy+c=0$ වෘත්තයට ඇඳි ස්පර්ශකයන්ගේ ජ්‍යායේ සමීකරණය $\alpha x+\beta y+(\alpha+x)g+(\beta+y)f+c=0$ බව විවරණය කරන්න.

$x+y=3$ සරල රේඛාව සමඟ $\tan^{-1}\left(\dfrac{1}{3}\right)$ ක කෝණයක් සාදනු ලබන සරල රේඛා දෙකක් $(l_1,l_2)$ ඇති බව පෙන්වා ඒවායේ අනුක්‍රමණ සොයන්න. ඉහත සරල රේඛා $A\equiv(2,1)$ ලක්ෂ්‍යයේ දී **සංගාමී වන බව** දී ඇත්නම් $l_1$ හා $l_2$ සොයන්න. තවද $x+y=3$ මත කේන්ද්‍රය පිහිටියා වූ ද, අරය ඒකක $\sqrt{5}$ ක් වූ ද, $l_1=0$ ස්පර්ශ කරන්නා වූ ද වෘත්ත දෙක $(S_1,S_2)$ සොයන්න. කේන්ද්‍රයේ **පාටිකය ධන අගයක් වූ** වෘත්තය $S=0$ නම්, $S$ **අපෝහනය** කරන්න. $A$ හි සිට $S=0$ ට ඇඳි ස්පර්ශකයේ ජ්‍යායෙහි සමීකරණය ලියා දක්වන්න. $S=0$ හි කේන්ද්‍රය $C$ ද, ස්පර්ශක ජ්‍යාය වෘත්තය ඡේදනය කරනු ලබන ලක්ෂ්‍යය $B$ හා $D$ ද නම් $ABCD$ වෘත්ත චතුරස්‍රයක් වන පරිදි වූ වෘත්තය, $x^2+y^2-9x+3y+10=0$ බව පෙන්වන්න.

**17.** (*a*) $\sin A$, $\cos A$, $\sin B$ හා $\cos B$ ඇසුරෙන් $\sin(A+B)$ ලියා දක්වන්න.

**ඒ නයින්,** $\cos(A+B)\equiv\cos A\cdot\cos B-\sin A\cdot\sin B$ බව ලබා ගන්න.

තවදුරටත්, $\sin 2A\equiv 2\sin A\cos A$ හා $\cos 2A\equiv\cos^2 A-\sin^2 A$ බව පෙන්වා,

$\sin 2A\equiv\dfrac{2\tan A}{1+\tan^2 A}$ හා $\cos 2A\equiv\dfrac{1-\tan^2 A}{1+\tan^2 A}$ බව **අපෝහනය** කරන්න.


දැන් සියලු $x\in\mathbb{R}$ සඳහා $T(x)\equiv\dfrac{2\tan x(1+\tan x)}{1+\tan^2 x}$ යැයි ගනිමු.

$T(x)\equiv a+b\sin(2x-\alpha)$ වන පරිදි $a$, $b$ හා $\alpha$ $\left(0<\alpha<\dfrac{\pi}{2}\right)$ තාත්ත්වික නියත නිර්ණය කරන්න.

**ඒ නයින්,** $x\in\left[\dfrac{-\pi}{2},\dfrac{3\pi}{4}\right)$ වසම තුළ $y=T(x)$ හි ප්‍රස්තාරයේ දළ සටහනක් අඳින්න.

(*b*) $ABC$ ත්‍රිකෝණයක් සඳහා සුපුරුදු අංකනයෙන් sin **නීතිය** ප්‍රකාශ කරන්න.

$PQ$ ඍජු සිරස් කුළුණක $Q$ මුදුන $P$ තිරස් මට්ටමේ පිහිටි $A,B$ හා $C$ ලක්ෂ්‍යවල දී $\alpha$, $2\alpha$ හා $3\alpha$ ආරෝහණ කෝණවලින් නිරීක්ෂණය වේ.




$BCQ\Delta$ සඳහා sin නීතිය භාවිතයෙන් හෝ අන් අයුරකින් හෝ,

$\dfrac{AB}{BC}=\dfrac{\sin 3\alpha}{\sin\alpha}$ බව පෙන්වන්න. තවදුරටත්

$\dfrac{AB}{BC}=1+2\cos 2\alpha$ බව පෙන්වා,

$AB\leq 3BC$ බව **අපෝහනය** කරන්න.

(*c*) $x\in\mathbb{R}$ සඳහා, $\tan^{-1}(-x)=-\tan^{-1}x$ ; බව සාධනය කරන්න.

$\sin^{-1}\left(\dfrac{4x}{x^2+4}\right)+2\tan^{-1}\left(\dfrac{-x}{2}\right)$ යන්න $x$ වලින් **ස්වායත්ත බව** පෙන්වා $x$ ට ගත හැකි තාත්ත්වික අගයයන් සොයන්න.

AL API ( PAPERS GROU

23, AL Api
Papers Group
The best group in the telegram